තංගල්ල ප්‍රාදේශීය සභාව
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
-------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 10 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජූලි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 16 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 ජුනි 06 දින පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් පරිත්‍යාග වශයෙන් ලද රු. 1,463,200 ක් වටිනා WPRD 4480 අංක දරන ට්‍රැක්ටරය සහ WPRD 8994 අංක දරන ට්‍රේලරය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද එකතුව රු. 141,340 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) 2012 ඔක්තෝබර් 25 දින සභාවට අත්පත් කරගත් රු. 675,000 ක් වූ කොලොන්න කන්ද ඉඩම 2013 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රාග්ධනිත කර නොතිබූ අතර ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයේද ඇතුළත් කර නොතිබුණි.

(ඇ) එකතුව රු.170,000 ක් වූ අයහාර වියදම් අයිතම 03 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එමින් පවතින , පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස ගෙවිය යුතු රු. 537,306 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලට ඇතුළත් කර නොතිබුණි.

(ඊ) හුම්මාන නරඹන්නන්ගෙන් අංක 87789 දරන ලදුපතින් ඉකුත් වර්ෂයේදී රැස්කර ගන්නා ලද රු. 97,860 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(උ) 2013 නොවැම්බර් 28, 29 හා 30 දිනවල මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යෙදවීමෙන් අංක 003563 දරන රු. 51,800 ක චෙක්පතක් සභාවට ලැබී තිබූ අතර එය දෙසැම්බර් මාසයේ අගරු වී තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට හිඟ වාහන කුලී උපලේඛනයේ එම රු. 51,800 ඇතුළත් කර නොතිබූ අතර ගිණුම්වලටද එය ඇතුළත් කර නොතිබුණි.

(ඌ) ආරම්භක ශේෂ ලෙජරයට ගැලපීමට තබනලද ජර්නල් සටහන් 01 හි වැටුප් ප්‍රතිපූර්ණ ගිණුමේ ආරම්භක ශේෂය රු. 771,500 ක්ලෙස දක්වා තිබුණද ලෙජරයේ එය රු. 71,500 ක් ලෙස සටහන් කර තිබුණි.

(එ) ඉකුත් වර්ෂයට අදාල එකතුව රු. 77,483 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් සේ සලකා ගිණුම්ගත කොට තිබුණි.

(ඒ) ලෙජරයේ 601 වැය ශීර්ෂයෙන් ආදායම් හා වියදම් ගිණුමට මාරුකල වටිනාකම රු. 5,122,072 ක් ලෙස දක්වා තිබුණද , ආදායම් හා වියදම් ගිණුමේ එය රු. 5,548,304 ක් ලෙස ගෙන තිබීමෙන් රු. 426,232 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 700,650 ක් වූ වියදම් වසරේ වියදමින් හා ණයහිමි වෙන්කිරීම් වලින් අත්හැරී තිබුණි.

(ඕ) පළාත් සභා මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීම වෙනුවෙන් 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත රු. 52,525 ක් ගෙවිය යුතු වුවත් එය ශේෂ පත්‍රයේ ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි.

### 1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂය ආරම්භයේ ලැබිය යුතු මුද්දර ගාස්තු, වසරේ මුද්දර ගාස්තු, වර්ෂය අවසානයේ ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම්වල මූල්‍ය ප්‍රකාශනවලට ගත් ශේෂය හා උපලේඛන , ලේඛනවල ශේෂය අතර රු. 32,481,511 ක පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 123,029,947 ක් වූ ගනුදෙනු සම්බන්ධව ලේඛන, උපලේඛන හා සමීක්ෂණ වාර්තා පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 334,912 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,383,777 ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**2.2.1** ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| i. | වරිපනම් හා බදු | 4,395 | 4,346 | 163 |
| ii. | බදුකුලී | 8,105 | 4,998 | 1,337 |
| iii. | බලපත්‍ර ගාස්තු | 881 | 971 | 50 |
| iv. | වෙනත් ආදායම් | 21,179 | 21,768 | 7,835 |

**2.2.2** බදුකුලී

---------

**(අ)** කඩකාමර බදුදීම

-------------------

යායවත්ත , රන්න හා නෙටොල්පිටිය (තේනගම ඇතුළු) කඩ කාමර බදුදීම වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. 167,593 ක් , රු. 238,976 ක් හා රු. 106,760 ක් හිඟව පැවතියද මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**(ආ)** රන්න සතිපොළ බදු ආදායම්

----------------------------------

රන්න සතිපොළෙහි අයිතිය 2012 වර්ෂය සඳහා රු. 1,928,000 ක මුදලකට බදුදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. බදු ගිවිසුමේ අංක 01 කොන්දේසිය අනුව බදු අයිතිය පැවරීමට පෙර බදු මුදලින් සියයට 25 ක් එනම් රු. 482,000 ක මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් ලෙස සභාවේ තැන්පත් කළයුතු බව දක්වා තිබුණි. නමුත් බදුකරු විසින් අවස්ථා 05 කදී එකතුව රු. 150,000 ක මුදලක් පමණක් ආරක්ෂිත ඇප තැන්පත් ලෙස තැන්පත් කර තිබියදී ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව සතිපොළ බදු අයිතිය ඔහු වෙත පවරා තිබුණි.

ii. බදුකරු විසින් බදු මුදල් නිසි පරිදි ගෙවා නොතිබූ අතර ඔහු 2013 අප්‍රේල් 12 දින මියගොස් තිබුණි. රු. 255,351 ක මුදලක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් හිඟව තිබුණි.

iii. ගිවිසුම් ප්‍රකාරව ඇපකරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඉන් එක් අයෙක් 2013 වර්ෂය සඳහා රන්න සතිපොළ බදුගත් බදුකරු බවද නිරීක්ෂණය විය. මෙවැනි තත්ත්වයක් පැවතියද සභා තීරණයක් මගින් ඉහත හිඟ මුදල් කපා හැරීම සඳහා තීරණය කර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ලිපියක්ද යොමු කොට තිබුණි.

2013 දෙසැම්බර් 31 දින වන විට හිඟ මුදල් වලින් සියයට 75 ක් අයකරගෙන ඇති බව සභාපතිවරයා විසින් 2014 නොවැම්බර් 25 දින මා වෙත දන්වා තිබුණි.

**2.2.3 බලපත්‍ර ගාස්තු**

----------------

සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ බලපත්‍ර ගාස්තු ආදායම රු. 50,010 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (4) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.4 අක්කර බදු**

-------------

සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ අක්කර බදු ආදායම රු. 101,628 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.5 සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් සහ තානායම් වලින් අයවිය යුතු ගාස්තු**

--------------------------------------------------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ලැබ ඇත්තා වූ හෝටල්, ආපනශාලා සහ නවාතැන්පොළ වලින් ගාස්තුව අයකරනු ලැබූ අවුරුද්දට පෙරාතුවම වූ අවුරුද්දේ ආදායමින් සියයට 1 ක් නොඉක්මවන ගාස්තුවක් අයකළ හැකි බව දක්වා තිබුණද පහත දැක්වෙන හෝටල් වලට අදාල ගාස්තු ගණනය කිරීමේදී අදාල වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ යන වර්ෂයන් දෙකෙහිම මූල්‍ය ප්‍රකාශන උපයෝගී කරගෙන ගණනය කිරීම් සිදුකර තිබූ අතර පහත පරිදි ගණනය කිරීමේ දෝෂ නිරීක්ෂණය විය.

**(අ) බේ හෝටලය**

-----------------

i. ඉහත ආයතනය මගින් 2011 මාර්තු 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයට අදාලව මූල්‍ය ප්‍රකාශන කට්ටල දෙකක් සභාවට එවා තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශනයන්හි පිරිවැටුමෙහි වෙනසක් පැවතුණි.

ii. ඉහත පරිදි සභාව වෙත එකම ගිණුම් කාලපරිච්ඡේදය සඳහා එවා තිබූ ගිණුම් කට්ටල දෙකම පදනම් කරගෙන සභාව විසින් 2012 වර්ෂයට බලපත්‍රය ලබාදීම සඳහා සියයට 1 ගාස්තුව සාවද්‍ය ලෙස ගණනය කිරීම නිසා රු. 392,798 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**(ආ) බකින්හැම් ලෙෂර් ලංකා පෞද්ගලික සමාගම**

------------------------------------------------------

2012 වර්ෂයට බලපත්‍රය ලබාදීමේදී 2011 සහ 2012 යන වර්ෂයන් දෙකට අදාල මූල්‍ය ප්‍රකාශන උපයෝගී කරගෙන 2011 වර්ෂයට අදාල මුළු පිරිවැටුම මත සියයට 1 ගාස්තුව ගණනය කර තිබූ අතර සභාව විසින් ඉකුත් වර්ෂයට අදාල ආදායම ගණනය කිරීමේදී 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව මාස 09 ක කාලයක් සඳහාද 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව මාස 03 ක කාලයක් සඳහාද පිරිවැටුම ගණනය කිරීම නිසා රු. 158,737 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

i. දැන්වීම් පුවරු සකස් කර මාස 09 ක පමණ කාලයක් ගත වී ඇතත් එම දැන්වීම් පුවරු ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස යොදාගෙන නොමැති බවද නිරීක්ෂණය විය.

ii. 2013 දෙසැම්බර් මස පැවති සභා රැස්වීම් වාර්තාවේ 5.7 ඡේදය අනුව දැන්වීම් පුවරු 05 ක් පමණක් ඉදිකිරීමට යෝජනා ඉදිරිපත් කර අනුමත කරගෙන තිබුණද ඊට පටහැනිව දැන්වීම් පුවරු 08 ක් මිළට ගෙන තිබුණි.

**(ඇ) දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම**

---

සභාවේ පවත්වාගෙන යනු ලබන ලිපිගොනු අනුව සහ 2013 දෙසැම්බර් 06 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු අනුව විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු 07 ක් සඳහා 2013 වර්ෂය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---

2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් එකතුව රු. 7,296,064 ක් උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අනුමත කරන ලද ඉදිකිරීම් හා අනු බෙදුම් අයදුම්පත්‍ර අදාල පාර්ශවයන් වෙත ලබා නොදීම**

---

අනුමත කරන ලද ඉදිකිරීම් හා අනුබෙදුම් අයදුම්පත්‍ර 64 ක් අදාල පාර්ශවයන් වෙත ලබානොදී මාස එකේ සිට වසරකට වඩා වැඩි කාල පරාසයක් සභාව තුළ රඳවා තබා ගැනීම තුළින් මහජනතාව අපහසුතාවයකට ලක් කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. මෙසේ අනුමත කරන ලද අයදුම්පත්‍ර අදාල පාර්ශවයන්ට ලබා නොදීමට හේතුව විගණනයට අනාවරණය නොවිය.

**(ආ) ආදායම් උත්පාදන මාර්ගයන් ලෙස විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු 08 ක් සභා බල ප්‍රදේශය තුල සවිකිරීම සඳහා සැකසීම**

---

ඉහත කාර්යය සඳහා 2013 මාර්තු 18 දින අංක 65 දරන වවුචරයෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු. 459,270 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

දැන්වීම් පුවරු සවිකළ ස්ථාන පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවූ අතර ඉන් 02 ක් සහා භූමිය තුළ ප්‍රයෝජනයට නොගෙන පවතින බව 2013 දෙසැම්බර් 06 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**(ඇ) කල් ඉකුත් වු චෙක්පත් නියාදනය නොකිරීම**

නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ එකතුව රු. 163,402 ක් වු චෙක්පත් 12ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) අනියම් , තාවකාලික හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් අනුමත කර නොගැනීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (1) වගන්තිය ප්‍රකාර සභාව විසින් තනතුරු 12 කරන ලද පත්වීම් සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලැබී නොතිබුණි.

**(ඉ) මානව සම්පත් කළමනාකරණය**

i. 2013 නොවැම්බර් මාසය සඳහා සකසන ලද සේවක සංඛ්‍යාව පිළිබඳ උපලේඛනය අනුව සභාවේ තනතුරු 08 ක පුරප්පාඩු 13 ක් සහ තනතුරු 13 ක අතිරික්තතා 23 ක් පවතින බව නිරීක්ෂණය විය.

ii. එම තොරතුරු අනුව සභාවේ අනුමත නොවූ තනතුරු 07 ක ස්ථිර කාර්ය මණ්ඩලය දෙදෙනෙකුද අනියම් , ආදේශක, තාවකාලික පදනම මත පස් දෙනෙකුද සේවය කරන බව නිරීක්ෂණය විය.

**3.2 අවිධිමත් ගනුදෙනු**

සභාව විසින් 2013 නොවැම්බර් 08 දින වවුචර් අංක 1027 න් පැරබෝල හට් 03 ක් සැකසීම වෙනුවෙන් රු. 690,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් සභා අරමුදල් යෙදවිය හැකි නීතිමය ප්‍රතාපාදන නොමැති කරුණක් සඳහා අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතියක් හා වියදම් දැරීම සඳහා සභා සම්මතයක්ද ලබාගෙන නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය වත්කම්**

අංක 252 – 6502 කැබ් රථය, කොන්ක්‍රීට් මිශ්‍රණය 2011 වසරේ සිටද , පාපැදි දෙකක් 2010 වසරේ සිටද , පස් තලන යන්ත්‍රයක් 2012 වසරේ සිටද ප්‍රයෝජනයට නොගෙන සභාවේ පැවති අතර එම වත්කම් 2003 ජනවාරි 03 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ප්‍රකාර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.2** **අයවැය පාලනය**

**-------------------**

සමාලෝචිත වර්ෂයේදී වියදම් විෂයයන් 09 ක් සඳහා අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු. 1,226,169 ක වියදම් දරා තිබුණු අතර ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තු අනුමත කරවාගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**-------------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඇ) සේවක ණය පරිපාලනය